# **2021 වර්ෂයේ 05 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව පරීක්ෂණයේ ප්‍රතිඵල මත 2022-06 ශ්‍රේණියට පාසල් සඳහා මාර්ගගත අභියාචනා අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්.**

***පොදු උපදෙස්***

01.2021 වර්ෂයේ 05 ශ්‍රේණි ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් සුදුසුකම් ලද සිසුන්ට 2022-06 ශ්‍රේණිය සඳහා පාසල් මේ වන විටත් ලබා දී ඇත.
මෙම මූලික අදියරේ දී පාසලක් නොලැබූ හෝ කිසියම් හේතුවක් මත ලැබී ඇති පාසලට ඇතුළත් විය නොහැකි සිසුවෙකු වේ නම් ඒ සම්බන්ධයෙන් අභියාචනා අයදුම්පතක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබෙනු ඇත. මෙම අභියාචනා අයදුම්පත් සම්පූර්ණ කිරීම මාරගගත වැඩසටහනක් ඔස්සේ පමණක් සිදු කෙරෙනු ඇති අතර 2022.06.15 සිට 2022.06.30 දක්වා කාලය තුළ ඊට අවස්ථාව ලැබේ.

02.අභියාචනා අයදුම්පත් සම්පූර්ණ කිරීම https://g6application.moe.gov.lk/#/ යන වෙබ් අඩවියට පිවිසී ලබා දී ඇති උපදෙස් අනුගමනය කරමින් දෙමාපියන්ට පෞද්ගලිකව ම සිදු කළ හැකි ය.

03.මාර්ගගත වැඩසටහන ඔස්සේ අභියාචනා අයදුම්පත් සම්පූර්ණ කිරීමට කිසියම් අපහසුතාවක් වේ නම්, සිසුවාගේ වර්තමාන පාසලේ විදුහල්පතිගෙන් හෝ එම පාසල අයත් කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරීන්ගෙන් අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා ගත හැකි ය.

04.අභියාචනා අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී ඉල්ලුම් කරන පාසලේ කඩඉම් ලකුණ පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර සිසුවා ලබා ඇති ලකුණු ප්‍රමාණය පාසල් කඩඉම් ලකුණට ගැලපෙන බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව පාසල් ඉල්ලුම් කරන්න. **සිසුවා ලබා ඇති ලකුණට නොගැලපෙන පාසල් ඉල්ලුම් කිරීම මගින් අභියාචනා ක්‍රියාවලිය මගින්ද පාසලක් නොලැබී යාමට ඉඩ ඇති බව අවධාරණය කර සිටිමු.**

**05.එක් අයදුම්කරුවෙකු සඳහා අභියාචනා අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ එකක් පමණක් වන අතර එම අයදුම්පත මගින් පාසල් 03ක් සඳහා අයදුම් කිරීමට අවස්ථාව ලැබේ.**

# මාර්ගගත අභියාචනා අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

01. https://g6application.moe.gov.lk/#/ යන වෙබ් අඩවිය වෙත පිවිසුණු පසුව "අභියාචනා ඉදිරිපත් කිරීම" යටතේ ලබා දී ඇති සබැඳිය මත ක්ලික් කරන්න.

02. එවිට ලැබෙන වෙබ් පිටුවේ සිසුවාගේ විභාග අංකය ඇතුළත් කර මාර්ගගත අයදුම්පත වෙත ප්‍රවේශ විය හැකි ය.

03. මුල් වරට පාසල් අයදුම් කිරීමේ දී ඔබ විසින් සපයා තිබූ පදිංචි ලිපිනය මේ වන විට වෙනස් වී ඇත්නම් ඒ බව සඳහන් කිරීමට කොටුවක් ලබා දී ඇති අතර එම කොටු මත ක්ලික් කිරීම මගින් නව පදිංචි ලිපිනය සඳහන් කිරීමට ඔබට අවස්ථාව ලැබේ.

04. ඔබගේ වර්තමාන පදිංචි ලිපිනයට අදාළ ව පහත තොරතුරු සම්පූර්ණ කරන්න.

- ✓ පළාත
- ✓ දිස්ත්‍රික්කය
- ✓ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
- ✓ ග්‍රාම නිලධාරී වසම

මෙම තෙරතුරු ඇතුළත් කිරීම අනිවාර්ය බව සලකන්න.

05. අනතුරුව අභිමත පාසල් 03ක් ඉල්ලුම් කිරීමට අවස්ථාව ලැබේ. පාසල් සංගණන අංක මීට පෙර ඔබ වෙත ලබා දී ඇති අතර එම තොරතුරු අනුව මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කළ හැකි ය. අයදුම්පතෙහි Add Schools මත ක්ලික් කර අදාළ කොටුව තුළ පාසල් සංගණන අංකය (Census No.) සඳහන් කර තමාට අවශ්‍ය පාසල ඇතුළත් කළ හැකිය. මේ සම්බන්ධයෙන් තවදුරටත් සහාය අවශ්‍ය බව හැඟෙන්නේ නම් ඒ සඳහා වර්තමාන පාසලේ විදුහල්පතිවරයා හෝ කලාප අධ්‍යාපන නිලධාරීන් සම්බන්ධ කරගන්න.

06. සියලු තොරතුරු සම්පූර්ණ කිරීමෙන් පසු පිටුවේ පහළ දකුණු කෙළවරේ ඇති Submit Application මත ක්ලික් කර අයදුම්පත යොමු කළ යුතු ය. තවද, එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණක් බව අවධාරණය කර සිටිමු.

07. අයදුම්පත Submit කළ පසුව එහි Pdf ආකෘතියක් බාගත කරගැනීමට ඔබට අවස්ථාව ලැබේ.

08. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් සහ පාසල් සංගණන අංක (Census No.) www.moe.gov.lk යන අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවියෙන් ලබාගත හැකි ය.

වැඩිදුර විමසීම් සඳහා 0112784845 දුරකථන අංකය මගින් පාසල් කටයුතු ශාඛාව අමතන්න.